# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,449 - 2025 අගෝස්තු මස 07 වැනි සිකුරාදා - 2025.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 166 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 172 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය

පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
පෙර හඳුන්වන ලද
(පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හා
පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ්)
අංක 450, ගාලු පාර,
කොළඹ 03.

............*පැමිණිලිකරු.*

| | | |
|---|---|---|
| නඩු අංකය | : | CHC/80/2022 MR |
| ස්වභාවය | : | ණය අයකර ගැනීම |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |
| වටිනාකම | : | රු. 306,152,908.55 |
| ඇස්කිසි අංකය | : | 05/2025 |

*- එදිරිව -*

1. බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාර, අංක 362 දරන සිය ලියාපදිංචි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන, ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2. දයා ධර්මපාල කිලිට්ටුව ගමගේ,
අංක 19/6ඒ, රෝහල් ටෙරසය,
සුනන්දාරාම පාරෙන් හැරී, කලුබෝවිල, දෙහිවල.

3. අනෝමා ගමගේ,
අංක 19/6ඒ, රෝහල් ටෙරසය,
සුනන්දාරාම පාරෙන් හැරී,
කලුබෝවිල, දෙහිවල.

............*විත්තිකරුවෝ.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී පැමිණිලිකරුට ඉහත 1, 2 සහ 3 වන විත්තිකරුවන්ගෙන් සමථ කොන්දේසි කඩ කිරීමේ හේතුව මත තීන්දු ප්‍රකාශිත මුදලවන රු. 306,152,908.55 ක මුදලක් සහ වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රු. 306,152,908.55 ක මුදලක් මත ද, නඩු තීන්දුවේ දින සිට එකී සමස්ථ මුදල ගෙවා නිමවන තුරු සමස්ථ මුදල මත ද වාර්ෂිකව 15% බැගින් පොළිය පැමිණිලිකරුට ගෙවන ලෙස තීන්දු කර ඇත.

එකී රු. 306,152,908.55 ක මුදලක් සහ වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රු. 306,152,908.55 ක මුදලක් මත ද, නඩු තීන්දුවේ දින සිට එකී සමස්ථ මුදල ගෙවා නිම වනතුරු සමස්ථ මුදල මත ද වාර්ෂිකව 15% බැගින් පොළියක් ද අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් බන්දුල විජේසිංහ විසින් ලියා සහතික කරන ලද 2018.09.20 දිනැති අංක 10650 දරන විකුණුම්කරයෙහි උපලේඛනයේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපළ වන,

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මයුරාවතී කෝරළේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නෙහැරුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මුදියන්සේගම සහ රත්නෙහැරුව ගම්වල පිහිටි පොල්හේන එස්ටේට් නමැති ඉඩමෙහි ලොට් 2 සහ 3 දරන ඉඩම්

**වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 02 වැනි දින පෙරවරු 11.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළේ පිහිටීම.-* ගිරිඋල්ල මංසන්ධියේ සිට කුරුණෑගල දෙසට මැටියගනේ මංසන්ධිය දක්වා කි. මී. 10 ක් පමණ ගමන් කර වමට හැරී මැටියගනේ දංගොල්ල පාරේ ඉදිරියට කි. මී. 9 ක් පමණ ගමන් කර දකුණට හැරී අඩි 20 ක් පමණ පළලැති බොරලු පාරේ ඉදිරියට තවත් මීටර 400 ක් පමණ ගමන් කිරීමෙන් පසු අදාළ දේපළ කරා ළඟා විය හැක. අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

*(අ)* ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) ද,
*(ආ)* සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාර නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,
*(ඇ)* විකුණුම් සඳහාවන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් (75%) වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවෙහි බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මයුරාවති කෝරළේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නෙහැරුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුදියන්සේගම සහ රත්නෙහැරුව ගම්වල පිහිටි පොල්හේන එස්ටේට් නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ආර්. එම්. රත්නපාල විසින් සම්පාදිත වර්ෂ 2017.11.28 වැනි දිනැති අංක 3360/01 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 නමැති උතුරින් : ඉහත කී පිඹුරු අංක 3360/01 හි ලොට් 1 ද, නැගෙනහිරින් : මෙගොඩවත්ත ද දකුණින් : ඉහත කී පිඹුරු අංක 3360/01 හි ලොට් 3 ද, බස්නාහිරින්: මැටියගනේ සිට කොවුල්වැවට යන ප්‍රාදේශීය සභා පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර හය (අ.6) ක විශාලත්වය ඇති ඉඩම වේ.

මෙම ඉඩම නාරම්මල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු අංක G 114/135 හි ලියාපදිංචි වී ඇත.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ, මයුරාවති කෝරළේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නෙහැරුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුදියන්සේගම සහ රත්නෙහැරුව ගම්වල පිහිටි පොල්හේන එස්ටේට් නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ආර්. එම්. රත්නපාල විසින් සම්පාදිත වර්ෂ 2017.11.28 වැනි දිනැති අංක 3360/01 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 නමැති උතුරින් : ඉහත කී පිඹුරු අංක 3360/01 හි ලොට් 2 ද, නැගෙනහිරින් : මෙගොඩවත්ත ද, දකුණින් : බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. අමරසිංහ විසින් සම්පාදිත පිඹුරු අංක 988 හි ලොට් 2 ද, බස්නාහිරින් : මැටියගනේ සිට කොවුල්වැවට යන ප්‍රාදේශීය සභා පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙක (අ.1, රූ. 2) ක විශාලත්වය ඇති ඉඩම වේ.

මෙම ඉඩම නාරම්මල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු අංක G 114/136 හි ලියාපදිංචි වී ඇත.

ප්‍රධාන රෙජිස්ට්‍රාර් සහ නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 07 වැනි දින දී ය.

08-97/1

---

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
පෙර හඳුන්වන ලද
(පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හා
පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ්)
අංක 450, ගාලු පාර,
කොළඹ 03.

................පැමිණිලිකරු

- එදිරිව -

| | | |
|---|---|---|
| නඩු අංකය | : | CHC/80/2022 MR |
| ස්වභාවය | : | ණය අයකර ගැනීම |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |
| වටිනාකම | : | රු. 306,152,908.55 |
| ඇස්කීසි අංකය | : | 05/2025 |

1. බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාර, අංක 362 දරන සිය ලියාපදිංචි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන, ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2. දයා ධර්මපාල කිලිට්ටුව ගමගේ, අංක 19/6ඒ, රෝහල් ටෙරසය, සුනන්දාරාම පාරෙන් හැරී, කලුබෝවිල, දෙහිවල.

3. අනෝමා ගමගේ,
අංක 19/6ඒ, රෝහල් ටෙරසය,
සුනන්දාරාම පාරෙන් හැරී,
කලුබෝවිල, දෙහිවල.

............*විත්තිකරුවෝ.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී පැමිණිලිකරුට ඉහත 1, 2 සහ 3 විත්තිකරුවන්ගෙන් සමථ කොන්දේසි කඩ කිරීමේ හේතුව මත තීන්දු ප්‍රකාශිත මුදල වන රු. 306,152,908.55 ක මුදලක් සහ වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රු. 306,152,908.55 ක මුදලක් මත ද, නඩු තීන්දුවේ දින සිට එකී සමස්ථ මුදල ගෙවා නිම වනතුරු සමස්ථ මුදල මත ද වාර්ෂිකව 15% බැගින් පොළිය පැමිණිලිකරුට ගෙවන ලෙස තීන්දු කර ඇත.

එකී රු. 306,152,908.55 ක මුදලක් සහ වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රු. 306,152,908.55 ක මුදලක් මත ද, නඩු තීන්දුවේ දින සිට එකී සමස්ථ මුදල ගෙවා නිම වනතුරු සමස්ථ මුදල මත ද වාර්ෂිකව 15% බැගින් පොළියක් ද අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩබ්ලිව්. කපුවැල්ල විසින් ලියා සහතික කරන ලද 2017.10.09 දිනැති අංක 236 දරන විකුණුම්කරයෙ හි උපලේඛනයේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපළ වන,

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මැද පත්තු කෝරළේ, නැගෙනහිර පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1565 සියඹලාවලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, සියඹලාවලාන ග්‍රාමයේ පිහිටි දික්කන්දවත්ත නමැති ඉඩමෙහි ලොට් XB3 දරන ඉඩම,

**වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 02 වැනි දින පස්වරු 1.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළේ පිහිටීම.-* ගිරිඋල්ල මංසන්ධියේ සිට කුරුණෑගල දෙසට මීටර 150 ක් පමණ මල්ගමුව මංසන්ධිය දක්වා ගමන් කර වමට හැරී සියඹලාවලාන පාරේ ඉදිරියට තවත් මීටර 300 ක් පමණ ගමන් කර වමට හැරී අඩි 15 ක් පළලැති පාරේ ඉදිරියට තවත් මීටර 100 ක් පමණ ගමන් කිරීමෙන් පසු අදාළ දේපළ කරා ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් -

*(අ)* ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) ද,
*(ආ)* සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාර නියෝජ්‍ය පිස්කල් තැනගේ ගාස්තු ද,
*(ඇ)* විකුණුම් සඳහාවන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් (75%) වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවෙහි බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ, මැද පත්තු කෝරළේ නැගෙනහිර, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1565 සියඹලාවලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, සියඹලාවලාන ග්‍රාමයේ පිහිටි දික්කන්දවත්ත නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. අයි. ජයසේකර විසින් සම්පාදිත වර්ෂ 2011 ක් වූ මාර්තු මස 26 වැනි දිනැති අංක 460/2011 පිඹුරේ දැක්වෙන ලොට් XB3 නමැති උතුරින් : ලොට් XA3 ද නැගෙනිහිරින් : පිඹුරු අංක 3485 හි ලොට් X3 ද මෙත්සිරි විජේසිංහට අයිති ඉඩම ද එස්. එල්. ටී. එස්. සමරවික්‍රමට අයිති ඉඩම ද දකුණින් : නාරංගමුව ග්‍රාමය නමැති රජයේ ඉඩම ද, බස්නාහිරින් : මෙත්සිරි විජේසිංහ සතු ඉඩම ද, මායිම් වූ එකී පිඹුරු අංක 460/2011 පරිදි ප්‍රමාණයෙන් අක්කර හතරයි රූඩ් දෙකක් (අ. 4, රූ. 2) *හෙවත්* 1.8211 හෙක්ටයාර් විශාලත්වය ඇති ඉඩම වේ.

මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු අංක E 375/29 හි ලියාපදිංචි වී ඇත.

**මාර්ග අයිතිය.-**

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මැද පත්තු කෝරළේ, නැගෙනහිර පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1565 සියඹලාවලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, සියඹලාවලාන ග්‍රාමයේ පිහිටි දික්කන්දවත්ත නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. අයි. ජයසේකර විසින් සම්පාදිත වර්ෂ 2011 ක් වූ මාර්තු මස 26 වැනි දිනැති අංක 460/2011 පිඹුරේ දැක්වෙන ලොට් XA3 දරන (අඩි 10 පළල පාර) නමැති ඉඩම උතුරින් : පිඹුරු අංක 460/2011 හි ලොට් A3 ද නැගෙනහිරින් : පිඹුරු අංක 3485 හි ලොට් X3 ද සහ මෙත්සිරි විජේසිංහට අයිති ඉඩම ද, දකුණින් : මෙත්සිරි විජේසිංහට අයිති පිඹුරු අංක 3485 හි ලොට් X3 සහ මෙම ඉඩමේ ලොට් XB3 ද, බස්නාහිරින් : පිඹුරු අංක 3485 හි ලොට් X3 ද මෙත්සිරි විජේසිංහට අයත් ඉඩම ද මායිම් වූ පිඹුරු අංක 460/2011 පරිදි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකයි දශම අට (රූ. 1, පර්. 1.8) හෙවත් හෙක්ටයාර් 0.1057 විශාලත්වය ඇති ඉඩම මතින් වන මාර්ග පරවශ්‍යතාවය ද වේ.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මැද පත්තු කෝරළේ, නැගෙනහිර පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1565 සියඹලාවලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, සියඹලාවලාන ග්‍රාමයේ පිහිටි දෙබොවෙ කැටකැලගහමුල වත්ත නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. අයි. ජයසේකර විසින් සම්පාදිත වර්ෂ 2011 ක් වූ මාර්තු මස 26 වැනි දිනැති අංක 460/2011 පිඹුරේ දැක්වෙන ලොට් A3 දරන (අඩි 10 පළල පාර) නමැති උතුරින් : ප්‍රාදේශීය සභා පාර ද නැගෙනහිරින් : පිඹුරු අංක 3981 හි ලොට් 3 ද මෙත්සිරි විජේසිංහට අයිති ඉඩම ද දකුණින් : ලොට් XA3 ද බස්නාහිරින් : පිඹුරු අංක 3981 හි ලොට් 3 ද මෙත්සිරි විජේසිංහ සතු ඉඩම ද මායිම් වූ එකී පිඹුරු අංක 460/2011 පරිදි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම නවය (පර්චස් 6.9) ක විශාලත්වය ඇති ඉඩම මතින් වන මාර්ග පරවශ්‍යතාවය ද වේ.

ප්‍රධාන රෙජිස්ට්‍රාර් සහ නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 07 වැනි දින දී ය.

08-97/2

---

**මීගමුව දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

.............*පැමිණිලිකරු.*

ගම්පහ දිසා අධිකරණ නඩු අංක :- MB/281
මීගමුව දිසා අධිකරණ ඇස්කිසි අංක :- 127/2022

*- එදිරිව -*

1. හේවාවසම් එපිලවත්තගේ උපුල්
2. ඩිලානි සංජීවිකා දියගහගේ

අංක - 3M/12 පළමුවන හරස් වීදිය, කිරිබත්ගොඩ, කැළණිය, යන ස්ථානයේ “ඩිලානි එන්ටර්ප්‍රයිසස්” යන නාමය අභිධානය විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යති.

.............*විත්තිකරුවෝ.*

වර්ෂ 2018 ක් වූ ජුනි මස 01 වැනි දින ගම්පහ දිසා අධිකරණයේ තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි වර්ෂ 2014.03.31 දිනට බැංකු අයිරා පහසුකමේ ශේෂයවන රුපියල් විසි එක් ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය තිස් හයයි ශත හැට හයක (රු. 2,143,736.66 ක) මුදලක් ද වර්ෂ 2014.04.01 දින සිට

සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් එකී විසි එක් ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය තිස් හයයි ශත හැට හයක (රු. 2,143,736.66 ක) මුදල මත වර්ෂයකට සියයට පහළොවක් (15%) වූ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන වැඩි දුර පොළිය සහ ව්‍යවස්ථාපිත ගාස්තුද වර්ෂ 2018 ක් වූ ජූනි මස 01 වැනි දින ඉහත දරන අධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශය අනුව පළවන හා දෙවන විත්තිකරුවන්ගෙන් අයකර ගනු ලැබිය යුතු වූ ඉහත සඳහන් අයවිය යුතු මුදල් නෛතික පොළිය සහ අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු පැමිණිලිකරුට අයකර දීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද ඉහත විත්තිකරුවන් විසින් උකස්කරන ලද පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින පස්වරු 2.00 ට,**

පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ, පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, රද්දොලුව ගමේ පිහිටි රද්දොලුව වත්ත වරිපනම් අංක 9/B/71/L නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ටී. සිල්වා විසින් මැන සකස් කරන ලද 1982.06.07 දිනැති අංක Gam/117 දරන පිඹුරේ ලොට් 739 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් :

උතුරට : ලොට් 747 (පාර) ද, නැගෙනහිරට : ලොට් 738 ද, දකුණට : ලොට් 734 සහ 733 ද, සහ බස්නාහිරට : ලොට් 740 ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතරක් (පර්චස් 4.4) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී162/259 හි ලියාපදිංචි වී ඇත.

එකී අංක Gam/117 දරන පිඹුරේ ලොට් 747 වශයෙන් ලකුණු කළ පාර පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

අධිකරණයේ අණ පරිදි,

එම්. එම්. කේ. ශ්‍රියාන්ත,
රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය/පිස්කල්,
දිසා අධිකරණය,
මීගමුව.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 29 වැනි දින දී ය.

08-98

---

### පානදුර දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 01, ලංකා බැංකු මාවත, අංක 1, "ලංකා බැංකු චතුරශ්‍රය" හි ප්‍රධාන කාර්යාලය පිහිටි ලංකා බැංකුව

නඩු අංකය : 3197/උකස්
ඇස්කිසි අංක : 09/24

.............*පැමිණිලිකරු.*

*- එදිරිව -*

පානදුර, කෙසෙල්වත්ත, හොරේතුඩුව, මඩකිස්ස පටුමග, අංක 51 හි "පැතුම් කන්ස්ට්‍රක්ෂන්" යන ව්‍යාපාරයේ හවුල්කරුවන්වන -

1. කොම්පඤ්ඤගේ නිල්මිනි ගංගා ෆොන්සේකා
2. රේන්දගේ තුෂාර ප්‍රියදර්ශන ප්‍රනාන්දු

...........*විත්තිකරුවන්.*

මෙම නඩුවේ වර්ෂ 2016 වූ ජූනි මස 24 වැනි දින දරන තීන්දුව ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව විත්තිකරුවන්ගෙන් අයවිය යුතු රුපියල් අට ලක්ෂ පනස් දහසක (රු. 8,50,000.00) මුදලක් මුල් මුදල වශයෙන් ද වර්ෂ 2014.12.05 වැනි දින දක්වා අයවිය යුතු පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය විසි හතරයි ශත අසූ එකක (රු. 2,72,824.81) මුදලක් ද යනාදි වශයෙන් එකතුව රු. 11,22,824.81 ක මුදලක් සහ එකී රු. 8,50,000.00 ක මුදල මත වර්ෂ 2014.12.06 වැනි දින සිට තීන්දු ප්‍රකාශය ඇතුලත් කරනු ලබන දින දක්වා වර්ෂයකට සියයට දහ හතර (14%) බැගින් වූ පොළියද ඉන් අනතුරුව සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු එම තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත නෛතික පොළිය ද නඩු ගාස්තුව වන රු. 12,500.00ක මුදල ද විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට පැමිණිලිකරුට හැකි බවට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් එකී නඩු තීන්දු ප්‍රකාශය අනුව එකී විත්තිකරුවන්ගෙන් අයවිය යුතු මුදල්, නෛතික පොළිය සහ නඩු ගාස්තු පැමිණිලිකරුට අයකර දීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 28 වැනි දින ප. ව. 1.00 ට,**

උග්ගල්බොඩ යන ගම පිහිටි ගන්කන්දගොඩවත්ත එස්ටේට් කියන ඉඩමේ අංක 3 දරන බිම් කොටසේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, අංක 716ඒ උග්ගල්බොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ කළුතර තොටමුන - උතුර කළුතර බැද්දේ උග්ගල්බොඩ ගමේ පිහිටි ගන්කන්දගොඩවත්ත එස්ටේට් යන ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ඩී. කේ. ප්‍රේමරත්න වර්ෂ 1995 ක් වූ අප්‍රේල් මස 20 වැනි දින මැන සාදන ලද අංක 3190 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද කැබලි අංක 3 දරන කොටසට මායිම් වන උතුරට මෙම ඉඩමේ කැබලි අංක 2 සහ 5 ද, නැගෙනහිරට කැබලි අංක 4 සහ 5 ද දකුණට : කැබලි අංක 59 (අඩි 20 ක් පළල) සහ කැබලි අංක 4 ද, බස්නාහිරට :- කැබලි අංක 59 සහ 2 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3190 දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම දෙකක් (පර්. 10.2 ක්) විශාල බිම සහ එහි පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි යනාදි සියල්ල වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 268/207 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී කැබලි අංක 3 නැවත මැන සාදන ලද පිඹුරු අංක 2762 ට අනුව පහත සඳහන් පරිදි විස්තර වේ -

ඉහත සඳහන් පරිදි උග්ගල්බොඩ ගමේ පිහිටි ගන්කන්දගොඩවත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක එම්. පී. රංජිත් ආනන්ද විසින් වර්ෂ 2008 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 2762 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද කැබලි අංක 3 දරන උතුරට : පිඹුරු අංක 3190 සඳහන් මෙම ඉඩමේ ම කැබලි අංක 2 සහ එම ඉඩමේ ම කැබලි අංක 5 ද, නැගෙනහිරට : පිඹුරු අංක 3190 සඳහන් මෙම ඉඩමේ කැබලි අංක 4 සහ මෙම ඉඩමේ කැබලි අංක 5 ද, දකුණට : අඩි 20 ක පාරක් සඳහා වෙන් කරන ලද මෙම ඉඩමේ කැබලි අංක 59 සහ පිඹුරු අංක 3190 හි සඳහන් මෙම ඉඩමේ කැබලි අංක 4 ද, බස්නාහිරට : අඩි 20 ක පාරක් සඳහා වෙන් කරන ලද මෙම ඉඩමේ කැබලි අංක 59 සහ පිඹුරු අංක 3190 හි සඳහන් මෙම ඉඩමේම කැබලි අංක 2 ද මායිම් වූ අංක 2762 දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම දෙකක් (පර්චස් 10.2) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ ගොඩනැගිලි ආදී සියල්ල වේ.

### දෙවන උපලේඛනය (මාර්ග අයිතිය)

ඉහත කී උග්ගල්බොඩ යන ගම පිහිටි ගන්කන්දගොඩවත්ත එස්ටේට් කියන ඉඩමේ පිඹුරු අංක 3190 සඳහන් (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන් කල) කැබලි අංක 59 දරන කොටසට මායිම් වන උතුරට : කැබලි අංක 1-7, 10, 19, 60, 24 සහ 38 නැගෙනහිරට: කැබලි අංක 30, 27, 16, 13, 2-7, 61, 8, 9, 20-23, 40 සහ 39 දකුණට : කැබලි අංක 13, 12, 60, 11, 10, 8, 9, 20-23, 40 සහ 39 බස්නාහිරට :- කැබලි අංක 59, 26, 28, 15, 14, 01, 13, 22, 60, 11, 10, 19, 24 සහ 38 ද යන මායිම් තුළ පිහිටි අංක 3190 ට අනුව රූඩ් එකයි පර්චස් විස්සයි දශම පහක් (රූ. 01, පර්චස්. 20.5) ක් විශාල ඉඩම වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 237/264 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී උග්ගල්බොඩ යන ගම පිහිටි ගන්කන්දගොඩවත්ත එස්ටේට් කියන ඉඩමේ පිඹුරු අංක 3190 සඳහන් (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කල) කැබලි අංක 56 දරන කොටසට මායිම් වන උතුරට : කැබලි අංක 29 සහ 59 සහ මෙම ඉඩමේ කොටසක්ද, නැගෙනහිරට : කැබලි අංක 30, 31, 37, 38, 59, 39, 43, 55 සහ 52, දකුණට : පාර, බස්නාහිරට : කැබලි අංක 38, 39, 58, 51, 48, 47, 57 සහ 44 ද යන මායිම් තුළ පිහිටි අංක 3190 ට අනුව පර්චස් තිස් අටක් (පර්චස් 38) ක් විශාල ඉඩම වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 255/277 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. එන්. පී. ෆොන්සේකා,
අධිකරණ රෙජිස්ට්‍රාර් 11 ශ්‍රේණිය,
සාමවිනිසුරු/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - කළුතර.

වර්ෂ 2025 ක් වූ ජූනි මස 27 වැනි දින දී ය.

08-100

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, ෆයිෆ් පාර, අංක 77 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි වූ Colombo Academy of Language Skills and Dramatic Art (Private) Limited පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

නඩු අංකය : HC (සිවිල්) 39/2025/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ එය ප්‍රකාරව අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

Colombo Academy of Language Skills and Dramatic Art (Private) Limited

...............*පෙත්සම්කරු.*

තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම විසින් ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 05, ෆයිෆ් පාර, අංක 77 ස්ථානයෙහි පිහිටි Colombo Academy of Language Skills and Dramatic Art (Private) Limited විසින් 2025 ක් වූ ජූලි මස 29 දින එකී අධිකරණයට පෙත්සමක් ගොනු කරනු ලැබුනු බවත්, එකී පෙත්සම 2025ක් වූ සැප්තැම්බර් මස 22 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට දායකයකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සශීන් අර්සකුලරත්න කන්නන්ගර, නීතිඥ,
අංක 11, ශාන්ත ජෝශප් පෙදෙස, කොළඹ 14.

**සටහන :**

එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු මෙසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් සශීන් අර්සකුලරත්න කන්නන්ගර නීතිඥවරියට ලිඛිතව දන්වා භාරදිය යුතුය. නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර **2025ක් වූ සැප්තැම්බර් මස 21 දිනට ප. ව. 6.00** ට පෙර භාරදිය යුතුය. *නැතහොත්* තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතුය.

සශීන් අර්සකුලරත්න කන්නන්ගර නීතිඥ,
අංක 11, ශාන්ත ජෝශප් පෙදෙස, කොළඹ 14.

08 - 133

## පාර්ලිමේන්තුව

### බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වරුණ ලියනගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි." යනුවෙන් හැඳින්වෙන කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

*(අ)* බුදු දහම, බෞද්ධ දර්ශනය හා බුදුරජාණන්වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳව රටවල්වල හා ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධකම් ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

*(ආ)* ශ්‍රී ලංකාව තුළ හා විදේශයන් හි වැඩවසන භික්ෂූන්ට පාවිච්චි කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර භාෂා පාසලක් පිහිටුවීම ; සහ

*(ඇ)* ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ඕනෑම ස්ථානයක සම්මන්ත්‍රණ, සමුළු, වැඩමුළු, මූලික අධ්‍යයන, දේශන පැවැත්වීම හා ඒ සඳහා අනුග්‍රහය දැක්වීම ;

යනාදිය වේ.

වරුණ ලියනගේ,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී,<br>
රත්නපුර දිස්ත්‍රික්කය.

08 - 101

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.